කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය - ප්‍රථම වසර

සෙමෙස්තර අවසාන පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2023/2024

**CCA 1202 - මාධ්‍ය හා නිර්මාණාත්මක කලා අධ්‍යයන ප්‍රවේශය**

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න　　　　කාලය පැය (02) දෙකයි

01. කලා නිර්මාණයක 'රමණීයත්වය' (Beauty) හා එකී නිර්මාණය මගින් සිදුවන 'වේදිත සම්ප්‍රේෂණය' (Expression of Feelings) සැකෙවින් හඳුන්වා දී කලාව පිළිබඳ ලියෝ ටොල්ස්ටෝයි දැරූ දෘෂ්ටිවාදය විග්‍රහ කොට දක්වන්න.

(ලකුණු 20)

02. මානව ජීවිතය අභිනව පර්යාලෝක සහිත ව විවරණය කිරීමෙහි ලා කලාවෙහි උපයෝගිතාව ඔබට අභිමත උදාහරණ දක්වමින් විභාග කරන්න.

(ලකුණු 20)

03. ගෝලීය ලේඛනය හා මුද්‍රණ තාක්ෂණය ප්‍රවර්ධනයෙහි ලා යුරෝපීය රටවලට සාපේක්ෂ ව නැගෙනහිර ආසියාතික රටවල භූමිකාව ප්‍රමුඛ වන්නේ කෙසේදැ යි යෝග්‍ය නිදර්ශන දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

04. සාම්ප්‍රදායික ගුවන්විදුලි මාධ්‍යයේ ස්වලක්ෂණ ඩිජිටල් තාක්ෂණය හා බද්ධ වූ ගුවන්විදුලිය මගින් විපර්යාසයට ලක් ව ඇත්තේ කවර ආකාරයෙන්දැ යි ප්‍රායෝගික නිදසුන් ඇසුරින් පෙන්වා දෙන්න.

(ලකුණු 20)

05. ලෝක සිනමාවේ ආරම්භක අවස්ථාවේ දී ම එය නිර්මාණාත්මක කර්මාන්තයක් බවට පත්කිරීමෙහි ලා විවිධ පර්යේෂකයින්ගේ නව සොයාගැනීම් උපස්තම්භක වූ ආකාරය උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

(අනෙක් පිටුව බලන්න)

06. විවිධ රූපවාහිනී වැඩසටහන් එහි අන්තර්ගතය හා ආකෘතිය අනුව එකිනෙකට වෙනස් වන ආකාරය රූපවාහිනී වැඩසටහන් ප්‍රවර්ග උදාහරණ කොට ගනිමින් විවරණය කරන්න.

(ලකුණු 20)

07. නව මාධ්‍යයේ ආරම්භය හා ව්‍යාප්තිය ජනමාධ්‍ය විෂයෙහි කර ඇති බලපෑම යෝග්‍ය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

(ලකුණු 20)

................................